ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2016/04/02

පැමිණිලිකරු : එම්. මහින්දරත්න මයා.
ස්වර්ණ නිවස,
රඹුක්පිටිය.

වගඋත්තරකරුවන් : ලේකම්.
මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යංශය.
පල්ලේකැලේ. කුණ්ඩසාලය.

පැමිණිලි අංකය : **HRC/K/313/14**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ. තමා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2-(ii) ශ්‍රේණියේ නිලධාරියෙකු ලෙස 2009.11.13 දින සිට සුදුසුකම් සපුරා ඇති අතර 2010.07.16 දින රඹුක්පිටිය මහා විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති ලෙස වැඩභාර ගැනීමෙන් පසු 2012.05.03 දින මප/ගම්/පත්තුනුපිටිය මහ විදුහලේ ස්ථාන මාරුවීම් ලැබ නියෝජ්‍ය විදුහල්පති ලෙස සේවය කරන ලද බවත්. 2014.01.20 දින එහි විදුහල්පතිනිය විශ්‍රාම යාමට නියමිතව තිබූ බැවින් තමාට වැඩ භාරදුන් බවත්ය. ඒ අතරතුර එනම් 2014.02.09 දින සහකාර විදුහල්පති ජේ.කේ නිමල් චන්ද්‍රසේන මහතා (ශ්‍රී.වි.සේ) ස්ථාන මාරු ලැබ පත්තුපිටිය විදුහලේ වැඩ භාරගත්තා ලද අතර ඒ අනුව 2014.01.20 දින වනවිට රඹුක්පිටිය මහා විද්‍යාලයේ ඇතිව තිබූ රඹුක්පිටිය විද්‍යාලයේ විදුහල්පති තනතුර විදුහල්පති සේවයේ 3 පන්තියේ නිලධාරියෙකු වූ ඉහත කී ජේ.කේ නිමල් චන්ද්‍රසේන මහතාට පිරිනැමීමට වගඋත්තරකරුවන් විසින් කටයුතු කර ඇති බවත්. එමඟින් තමාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත් පැමිණිල්ලෙන් සඳහන් කර ඇත.

ඊට හේතුව නම් රඹුක්පිටිය මහා විද්‍යාලය 1 සී වර්ගයේ පාසලක් බැවින් විදුහල්පති පත්වීමක් එම විද්‍යාලයට ලබා දෙන්නේ නම් විදුහල්පති සේවයේ I හෝ II ශ්‍රේණියේ අයකුගෙන් පත්කිරීමක් සිදුකළ යුතු බවයි. පත්තුනුපිටිය විද්‍යාලයේ විදුහල්පති විශ්‍රාම ලබා ගියද 2015.05.30 වන තෙක් එම විදුහල්පති පත්වීම හෝ ලබා දී නොමැති බව පැමිණිල්ලෙන් සඳහන් කර ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන ... ලේකම් ... ක්ෂණික ... වෙබ්

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කරමින් පැමිණිලිකාර මහින්දරත්න මහතා 2014.09.24 දින සිට මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යංශ ලේකම්වරයා විසින් මප/ගම් පත්තුනුපිටිය විදුහලේ විදුහල්පතිවරයා ලෙස ස්ථානගත කර ඇති බවත් ඒ අනුව අදාළ සහන ලබා දී ඇති බවත් දක්වා ඇත. පැමිණිලිකරු රඹුක්පිටිය විද්‍යාලයේ විදුහල්පති තනතුරට විධිමත් ලෙස ඉල්ලීම් සිදුකර නොමැති බවත් ඔහු විසින් පුරප්පාඩු නොමැති අවස්ථාවක එනම්. 2013.11.20 දින විදුහල්පති තනතුර ලබා දෙන ලෙස ඉල්ලීම් කර තිබූ නමුත් එම අවස්ථාවේ ලබා දීමට හැකියාවක් නොතිබූ බවත්. පුරප්පාඩු ඇති වූ 2014.01.20 දිනෙන් පසු ඉල්ලීම් කර නොතිබූනු බවත් නමුත් දැනට එම විදුහලේ විදුහල්පති ලෙස සේවය කරන නිමල් චන්ද්‍රසේන මහතා විධිමත් පරිදි ඉල්ලීම් කර තිබූ බැවින් ඔහුට රඹුක්පිටිය විදුහලේ විදුහල්පති තනතුරේ 2014 මාර්තු මස සිට පිහිටවනු ලැබූ බවත්. පැමිණිලිකරු විසින් මහ/ගම් පත්තුනුපිටිය විද්‍යාලයේ විදුහල්පති ලෙස පිහිටුවන ලෙස කරන ලද ඉල්ලීම අනුව 2014.09.29 දින සිට ඉල්ලුම් කරන ලද විද්‍යාලයේ විදුහල්පති තනතුරේ ස්ථානගත කරන ලද බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකරුගේ විරෝධතා දැක්වීම :-

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2-(ii) ශ්‍රේණියේ නිලධාරියෙකු වන තමා මප/ගම්/ පත්තුනුපිටිය විද්‍යාලයේ 2014.09.24 දින සිට විදුහල්පති තනතුරේ සිටි බව පිළිගන්නා නමුත් තමා 2014.01.20 දින විධිමත් ලෙස ඉල්ලීම් කළේ 1 සී පාසැලක් වන මප/මහ රඹුක්පිටිය විදුහලේ විදුහල්පති තනතුරේ පිහිටුවන ලෙස බවත්. ඉල්ලුම්පත් ඉදිරිපත් නොකළ බව ප්‍රකාශ කිරීම සාවද්‍ය බවත්. දිවයිනේ 1 හා 2 ශ්‍රේණි විදුහල්පතිවරු බොහෝ සිටින බවත් එසේ සිටියදී ප්‍රශ්නගත පාසැල 1 සී ශ්‍රේණියේ පාසලක් හෙයින් චක්‍රලේඛන පරිදි විදුහල්පති සේවයේ 1 හෝ 2 පන්තියේ නිලධාරියෙකු පත්කළ යුතු බව නියෝග දී තිබියදී 3 පන්තියේ නිලධාරියෙකු පත්කිරීමෙන් තමාගේ මූලික අයිතිවාසිකම් මෙන්ම පාසලේ ළමුන්ගේද අයිතිවාසිකම් උල්ලංඝනය කරන බවත්. සඳහන් කර ඇත. තමා 2013 වසරේ රඹුක්පිටිය විද්‍යාලයේ විදුහල්පති තනතුරට ඉල්ලීම් කළ බවත්. ඒ බව වගඋත්තර පාර්ශවයද පිළිගන්නා බවත් ඒ වන විට පුරප්පාඩු නොතිබූ බව තමා දැන සිටි බවත්. 2014.01.20 අයදුම් නොකළේ තම පෞද්ගලික ගොනුව අනුව හෝ පරීක්ෂා කොට තමා හට රඹුක්පිටිය විද්‍යාලයේ විදුහල්පති ලෙස පත්කිරීමට අවකාශ තිබූ බවත්. තමා 2014.01.20 දින විධිමත් ලෙස මප/ගම් රඹුක්පිටිය විද්‍යාලයේ විදුහල්පති තනතුර සඳහා ගම්පොල කලාප අධ්‍යක්ෂ හා මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ නිර්දේශ සහිතව යොමුකළ බවත්ය වැඩිදුරටත් සඳහන් කර ඇත.

වගඋත්තර පාර්ශවයේ වැඩිදුර කරුණු දැක්වීම :-

පැමිණිලිකරුගේ ඉහත කරුණු දැක්වීම සම්බන්ධයෙන්ද වගඋත්තර පාර්ශවය විසින් වැඩිදුර කරුණු ඉදිරිපත් කරමින් පැමිණිලිකරු විධිමත් ඉල්ලීමක් කර නොතිබූ බවත්. 2013 වසරේ රඹුක්පිටිය විද්‍යාලයේ පුරප්පාඩු නොතිබූ බවත්. 2013.11.23 දින එම පාසලට ඉල්ලීම් කර ඇති බව දැනගන්නා

ලද්දේද ගැටළුව උද්ගත වීමෙන් පසු බවත්. රඹුක්පිටිය විද්‍යාලය 1 සී පාසලක් බව තමාද පිළිගන්නා බවත් සඳහන් කර ඇත.

නිරික්ෂණ :-

පැමිණිලිකාර පාර්ශවය විදුහල්පති සේවයේ 2-(ii) ශ්‍රේණියේ නිලධාරියෙකු වන අතර ඔහු වර්තමානයේ මප/ගම් පත්තුනුපිටිය විද්‍යාලයේ විදුහල්පති ලෙස සේවයේ යෙදී සිටින බවත්. පැමිණිලිකරු ස්ථාන මාරුවීම් ඉල්ලන ලද පාසල අධ්‍යාපන අමාත්‍යංශ චක්‍රලේඛන වලට අනුව 1 සී ශ්‍රේණියේ පාසලක් බවත්. ඒ සඳහා විදුහල්පතිවරයෙක් තේරීමේදී අනිවාර්යයෙන් විදුහල්පති සේවා 1 හෝ 2 ශ්‍රේණියේ නිලධාරියෙකු පත්කළ යුතු බව නිරික්ෂණය වේ.

පැමිණිලිකරු විසින් 2013.11.20 දින මහ/ගම් රඹුක්පිටිය විද්‍යාලයේ විදුහල්පති තනතුර සඳහා ඉල්ලුම් කර ඇති බවත් ඒ වන විට රඹුක්පිටිය විද්‍යාලයේ විදුහල්පති තනතුර සඳහා ඇබෑර්තු නොමැති බවත් නිරික්ෂණය වේ.

අනතුරුව මප/ගම් රඹුක්පිටිය විද්‍යාලය 2014.01.19 පසු ඇති වූ විදුහල්පති පුරප්පාඩු සඳහා පැමිණිලිකාර පාර්ශවය විසින් 2014.01.20 දින ගම්පොල කලාප අධ්‍යක්ෂ හා මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශ සහිතව ඉල්ලීම් කර ඇති අතර. පැමිණිලිකාර පාර්ශවයේ ඉල්ලීම් නොසලකා පත්වීම් ප්‍රධානය කළායැයි සඳහන් නිමල් චන්ද්‍රසේන මහතාට 2014 මාර්තු මස රඹුක්පිටිය විද්‍යාලයට පත්වීම් ප්‍රධානය කර ඇත. ඔහු විදුහල්පති සේවයේ 3 ශ්‍රේණියේ නිලධාරියෙකු බව නිරික්ෂණය වේ.

කෙසේ වුවද මප/ගම් පත්තුනුපිටිය විද්‍යාලයේ විදුහල්පති පුරප්පාඩුව ඇති වූ බැවින් පැමිණිලි පාර්ශවය එම විද්‍යාලයේ විදුහල්පති සේවයේ පිහිටුවන ලෙස ඉල්ලීම් කර ඇති අතර. ඒ අනුව පැමිණිලිකාර පාර්ශවයේ පත්තුනුපිටිය විද්‍යාලයේ විදුහල්පති ලෙස මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම්ගේ අංක සීපීසී/සීඑම්සී/1/28/1/3 හා 2014.09.24 දින ලිපිය විදුහල්පති තනතුර ප්‍රධානය කර ඇත.

නමුත් පැමිණිලිකාර පාර්ශවයේ ඉල්ලීම වතුයේ ලබා දී ඇති පාසල විදුහල්පති ශ්‍රේණියේ 3 පන්තියේ නිලධාරියෙක් පත්කළ හැකි පාසලක් වන අතර පැමිණිලිකාර පාර්ශවය ඉල්ලීම් කර ඇති පාසල වන රඹුක්පිටිය පාසල 1 සී පාසලක් බැවින් එම පාසලේ විදුහල්පති පත්වීම් අපේක්ෂාවෙන් පැමිණිලිකරු විධිමත් ලෙස 2014.01.20 දින අයදුම්පත් ඉදිරිපත් කර ඇති බවයි.

නිගමනය :-

පැමිණිලිකරු විදුහල්පති සේවයේ 2 පන්තියේ නිලධාරියෙකු වන අතර ඔහු විසින් මප/ගම් රඹුක්පිටිය විද්‍යාලයේ විදුහල්පති පුරප්පාඩු ලෙස ගම්පොල කලාප අධ්‍යක්ෂකගේ හා මධ්‍යම පළාත් අධ්‍යක්ෂවරයාගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කර ඇති බව සනාථ වේ. එසේ හෙයින් වගඋත්තර

පාර්ශවය විසින් චෝදනා කරනු ලබන ඉල්ලීම් නොකලා යැයි චෝදනාව සත්‍යයෙන් තොර බව නිගමනය කරයි.

රඹුක්පිටිය විද්‍යාලය 1 සී පාසලක් බවත් අධ්‍යාපන අමාත්‍යංශ චක්‍රලේඛනයට අදාළ පාසලේ විදුහල්පතිවරයෙක් පත්කිරීමේදී තේරා පත් කරගත යුත්තේ විදුහල්පති සේවයේ 2 ශ්‍රේණියේ විදුහල්පතිවරයෙකු බව සඳහන් වන බවත් වගඋත්තරකරුවන් විසින් පිළිගෙන ඇත.

එසේ තිබියදී විදුහල්පති සේවයේ 3 පන්තියේ නිලධාරියෙක් වන නිමල් චන්ද්‍රසේන මහතා මප/ගම් රඹුක්පිටිය විද්‍යාලයට තෝරා ගැනීම තුළින් පැමිණිලිකාර පාර්ශවයට අගතියක් සිදුව ඇති බව අනාවරණය වේ.

පැමිණිලි විභාගයේදී පැමිණිලිකාර පාර්ශවය විසින් ඉල්ලීම් කර ඇත්තේ දැනට නීත්‍යානුකූල නොවන අයුරින් මප/ගම්/ රඹුක්පිටිය විද්‍යාලයේ විදුහල්පති සේවයේ පිහිටුවා ඇති නිමල් චන්ද්‍රසේන මහතාව පැමිණිලිකරු දැනට සේවයේ නියුතු මප/ගම් පත්තුනුපිටිය විදුහලේ විදුහල්පති සේවයේ පිහිටුවන ලෙස හෝ එකී ඉල්ලීම ඉටු කිරීමට අපහසු නම් පැමිණිලිකරු 1 සී හෝ ඊට ඉහළ පාසලක විදුහල්පති පත්වීම් ලබා දීමට කටයුතු කරන ලෙසයි. එකී ඉල්ලීම පිළිබඳ සලකා බැලීමේදී පැමිණිලිකාර පාර්ශවය එවැනි ඉල්ලීමක් සිදුකිරීමට නීත්‍යානුකූල හැකියාවක් ඇති අතර එම ඉල්ලීම සාධාරණ වන බවටද කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

ඉහත නිරීක්ෂණ හා නිගමන අනුව වගඋත්තර පාර්ශවීය ක්‍රියාකලාපය තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති 'නීතිය ක්‍රියාත්මක කිරීම, නීතිය පසිඳලීම නීතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුත්තේය' යන්න පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කර සිටී.

නිර්දේශය :-

1. පැමිණිලිකරුගේ ශ්‍රේණියට සරිලන පාසැලක් නියමිත ක්‍රියාපටිපාටිය ප්‍රකාරව ලබා දීමට කටයුතු කරන ලෙස නිර්දේශ කරනු ලැබේ.

2. පැමිණිලිකරුගේ ශ්‍රේණියට සරිලන පාසලක් නොලැබීම තුළින් පැමිණිලිකරුට සිදුවූ අගතිය වෙනුවෙන් වගඋත්තර පාර්ශවය විසින් පැමිණිලිකරු වෙත රු. 50,000/- ක මුදලක් ගෙවිය යුතුය.

2018.09.10 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- ලේකම්.
අධ්‍යාපන අමාත්‍යාංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

B/